# LABOUR COSTING
# ( Part-II )

***S. Madushanka***
***B.Sc (Mgt) Accounting (Special) (U.G)***
***University of Sri Jayewardenepura***

# වැටුප් ගෙවීමේ ප්‍රධාන පදනම් (ක්‍රම)

1) කාල පදනම
2) නිමැවුම් පදනම

## 1) කාල පදනම

සේවකයා සේවයේ යෙදී සිටි කාලය පදනම් කර ගෙන, වැටුප් ගෙවීම කාල පදනම වේ. එලෙස ගෙවන වැටුප් කාල වැටුප් ලෙස හැඳින්වේ.

කාලය පදනම මත වැටුප් ගෙවීම සිදු කරන්නේ පහත පරිදි වේ.

වැටුප = සාමාන්‍ය කාලය x වැටුප් අනුපාතය

ClassWork.LK

## 2) නිමැවුම් පදනම

සේවකයා නිපදවන ලද නිමැවුම් ප්‍රමාණය පදනම් කර ගෙන වැටුප් ගෙවීම නිමැවුම් පදනම වේ. එලෙස ගෙවන වැටුප් ''කෑලි වැටුප්'' ලෙස හැඳින්වේ.

නිමැවුම් පදනම මත වැටුප් ගෙවීම ගණනය කරන්නේ පහත පරිදි ය.

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | = | නිපදවන ලද ඒකක ප්‍රමාණය | x | ඒකකයට අනුපාතය |

ClassWeb.LK

# කාල පදනම හා නිමැවුම් පදනම සැසඳීම

| කාල පදනම | නිමැවුම් පදනම |
|---|---|
| • සේවකයා වැඩ කළ කාලය පදනම් කර ගෙන වැටුප් ගෙවීම සිදු කෙරේ. | • සේවකයා නිම කළ ඒකක ගණන පදනම් කර ගෙන වැටුප් ගෙවීම සිදු කෙරේ. |
| • සේවකයන්ගේ වැඩ ප්‍රමාණය නිශ්චිතව මැනීමට අපහසු අවස්ථාවල දී යෝග්‍ය වේ. | • සේවකයන්ගේ වැඩ ප්‍රමාණය නිශ්චිතව මැනිය හැකි අවස්ථාවල දී පමණක් යෝග්‍ය වේ. |
| • සේවකයෝ දිරිමත් නොවෙති. | • සේවකයෝ දිරිමත් වෙති. |
| • ආධුනික සේවකයන්ට වාසිදායක වේ. | • ආධුනික සේවකයන්ට අවාසිදායක වේ. |
| • නිරන්තර අධීක්ෂණයක් අවශ්‍ය වේ. | • අධීක්ෂණය අවශ්‍ය වන්නේ අඩුවෙනි. |

ClassWork.LK

# අතිකාල දීමනා

අතිකාල දීමනා යනු තමාට නියමිත කාලයට අමතර ව වැඩ කරන අතිරේක කාලය වෙනුවෙන් කරන ගෙවීම වේ. ඒ සඳහා සාමාන්‍ය වැටුප් අනුපාතිකයට වඩා ඉහළ අනුපාතිකයක් සාමාන්‍යයෙන් ගෙවනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| අතිකාල දීමනා | = | අතිකාල පැය ගණන | x | අතිකාල පැයක වැටුප |

ClassWork.LK

# වැටුප් ලේඛනය

වැටුප් ලේඛනයක් යනු නිශ්චිත කාලසීමාවකට අදාළව සේවකයන්ගේ මුළු වැටුප, වැටුපෙන් සිදු කරන අඩු කිරීම්, ශුද්ධ වැටුප හා අර්ථසාධක අරමුදලට දායකවීම්, සේවා නියුක්ති භාර අරමුදලට දායකවීම් ඇතුළත් කර පිළියෙල කරන ලේඛනයකි.

වැටුප් පාලන අංශය විසින්, වැටුප් ලේඛන පිළියෙල කිරීම සාමාන්‍යයෙන් සිදු කෙරේ.

ClassWork.LK

## වැටුප් ලේඛනයක ඇතුළත් වන අයිතම හා ඊට අදාළ තොරතුරු ලබාගන්නා මූලාශ්‍ර

| ඇතුළත් වන අයිතම | මූලාශ්‍ර ලේඛන |
|---|---|
| මූලික වැටුප / ඒකාබද්ධ වැටුප | ▪ පත්වීම් ලිපිය |
| අතිකාල දීමනා | ▪ අතිකාල දීමනා පත්‍ර<br>▪ අතිකාල ලේඛනය |
| සේවක අර්ථසාධක අරමුදලට දායක වීම්<br><br>සේවා නියුක්ති භාර අරමුදලට දායක වීම් | ▪ ව්‍යවස්ථාපිත නීති<br>▪ සේවක අර්ථසාධක අරමුදල් පනත<br>▪ සේවා නියුක්ති භාර අරමුදල් පනත |
| වැටුප් අත්තිකාරම් | ▪ සේවකයා අත්සන් කර ඉදිරිපත් කරන ලිපිය |
| සේවක රක්ෂණ වාරිකය | ▪ සේවකයා අත්සන් කර ලබා දී ඇති ලිපිය |

ClassWork.LK

# වැටුප් ලේඛනයක ආකෘතියක්

සීමා සහිත ............................................ සමාගමේ

.................... වර්ෂය ................. මාසයේ වැටුප් ලේඛනය

| | | | ඉපයීම් | | | | අඩු කිරීම් | | | | | රු. | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුක්‍රමික අංකය | සේවක අංකය | නම | මූලික වැටුප | අතිකාල දීමනා | දීමනා | දළ වැටුප | සේවක අර්ථසාධක දායකය | වැටුප් අත්තිකාරම් | සේවක | මුළු අඩු කිරීම් | ශුද්ධ වැටුප | EPF දායකත්වය | ETF දායකත්වය | සේවකයාගේ අත්සන |
| 01 | ආර් | ගුණපාල | | | | | | | | | | | | |
| 02 | එස්. | නානායක්කාර | | | | | | | | | | | | |
| 03 | ඒ. | ඒකනායක | | | | | | | | | | | | |
| 04 | එම්. | නවරත්න | | | | | | | | | | | | |
| 05 | ඩී. | දිසානායක | | | | | | | | | | | | |
| 06 | යූ | ධර්මදාස | | | | | | | | | | | | |

ClassWork.LK

# වැටුප් ලේඛනයක ඇතුළත් වන තොරතුරු වැටුප් හා වේතන පාලන ගිණුමක් ඇසුරෙන් ගිණුම්ගත කිරීමට අදාළ ජර්නල් සටහන්

- **මුළු දළ වැටුප**

| | |
|---|---|
| වැටුප් හා වේතන ගිණුම | හර xxx |
| වැටුප් හා වේතන පාලන ගිණුම | බැර xxx |

- **සේවකයාගේ වැටුපෙන් කරන අඩු කිරීම්**

| | |
|---|---|
| වැටුප් හා වේතන පාලන ගිණුම | හර xxx |
| අදාළ අඩු කිරීම් ගිණුම් | බැර xxx |

- **ආයතනයේ සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය**

| | |
|---|---|
| සේවක අර්ථසාධක අරමුදල් වියදම් ගිණුම | හර xxx |
| ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම | බැර xxx |

ClassWork.LK

- **සේවා නියුක්ති භාර අරමුදල් දායකත්වය**

  සේවා නියුක්ති භාර අරමුදල් වියදම් ගිණුම හර xxx

  ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල් වියදම් ගිණුම බැර xxx

- **ශුද්ධ වැටුප මුදලින් ගෙවූ විට,**

  වැටුප් හා වේතන පාලන ගිණුම හර xxx

  මුදල් ගිණුම බැර xxx

- **ශුද්ධ වැටුප මුදලින් නොගෙවූ විට,**

  වැටුප් හා වේතන පාලන ගිණුම හර xxx

  ගෙවිය යුතු වැටුප් හා වේතන ගිණුම බැර xxx

ClassWork.LK

ගිණුම් කාල පරිච්ඡේදය අවසානයේ දී වැටුප් හා වේතන ගිණුමේ ශේෂය, සේවක අර්ථසාධක අරමුදල් වියදම් ගිණුමේ ශේෂය, සේවා නියුක්ති භාර අරමුදල් වියදම් ගිණුමේ ශේෂය, ලාභාලාභ ගිණුමට (ආදායම් ප්‍රකාශයට) මාරු කළ යුතුය.

Class Work

## අභ්‍යාසය

සීමිත නාඹටුන්න පොදු සමාගමේ 2022 මාර්තු මාසයේ සේවකයන්ගේ වැටුප් ගෙවීම්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

1) මාසයක් තුළ වැඩ කළ යුතු සම්මත පැය ගණන 160 කි.

2) පැයක මූලික වැටුප රු. 200 කි.

3) අතිකාල පැයක වැටුප මූලික වැටුපෙන් 150% කි.

4) මූලික වැටුප මත සේවක අර්ථසාධක අරමුදලට

   සේවකයාගෙන් 10% ක්ද

   ආයතනය 15% ක්ද දායක කළ යුතුයි.

5) සේවා නියුක්ති භාර අරමුදලට සේවකයාගේ මූලික වැටුපෙන් 3%ක් දායක කළ යුතු ය.

**අවශ්‍යවන්නේ,**

i) 2022 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය

ii) පොදු ජර්නල් සටහන්

iii) ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura